**උක් පර්යේෂණ ආයතනය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උක් පර්යේෂණ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020දෙසැම්බර්31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරනපාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින්නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනයපිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක ආයතනය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත්සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 24 (අ) ඡේදය ප්‍රකාරව අස්ථිත්වයන් විසින් අයවැය ගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යාවන් වෙන වෙනම නිරූපණය කළ හැකි පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල එසේ අයවැයගත සංඛ්‍යා ඇතුළත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යා වෙන වෙනම නිරූපණය කරමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුකූල නොවන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ පාරිතෝෂික වෙන්කිරීම රු.9,134,287 ක් අඩුවෙන් හා වෛද්‍යාධාර වෙන් කිරීම් රු.202,000 ක් වැඩියෙන් දක්වා තිබූ අතර උපචිත වියදම් රු.24,726,561 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් යෙදවීමක් ලෙස දක්වා ඒ යටතේ දැක්විය යුතු වසරකින් කල් පිරෙන රු.64,844,612 ක් වටිනා ස්ථාවර තැන්පතු මුදල් හා මුදල් සමාන දෑයටතේ ද, මුදල් හා මුදල් සමාන දෑ යටතේ | පාරිතෝෂික වෙන් කිරීම සඳහා ලබා දී ඇති පිළිතුර නිවැරදි නොවේ. මිලදී ගැනීම් ඇනවුම් ලබා දී තිබූ උපකරණ හා වැඩ උපචිත කොට ඇත.වසරකින් කල් පිරෙන ස්ථාවර තැන්පතු කෙටි කාලීන ආයෝජන වශයෙන් හඳුනා ගෙන ඇත. මුදල් හා මුදල් සමාන දෑවල අගය හා වෛද්‍යාධාර මුදලින් කළ ගෙවීම් නිවැරදි විය යුතුය. | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| දැක්විය යුතු බැංකු මුදල් ශේෂය රු.202,000 ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | | |
| (ඇ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව අතීතානුයෝගීව ගලපා මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුව තිබුණු රු. 39,552,362 ක් අතීතානුයෝගීව ගලපා මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රමිති අංක 03 ප්‍රකාරව පෙර වර්ෂ ගැලපුම් අතීතානුයෝගීව ගලපා මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පොත් වටිනාකම රු.118,873,548 ක් වූ ආයතනය සතු 57 ක් වන සියලුම වාහන දැනටමත් භාවිතා කරමින් පවතින නමුත් ඒවායේ ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමටත්, ප්‍රමිත අංක 7 (92) (ආ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවලින් එම වත්කම් පිළිබඳ අනාවරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ආයතනය සතුව පවතින වාහන 2021 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර පොත්වලට ගැනීමටඅවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී | ප්‍රමිති අංක 03 අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 47 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණන අගය මත මූල්‍ය ප්‍රකාශනවල දක්වන දේපළ පිරියත හා උපකරණ සෑම වර්ෂ 3 කට හෝ 5 කට වරක් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතු වුවද, 2015 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර තිබුණු අගය රු.158,056,049 ක් වූ දේපළ පිරියත හා උපකරණ සහ 1997 වර්ෂයේ සිට ගත්මිල රු.65,000 ක් වූ හන්තාන උඩුවෙල අක්කර 3 පර්චස් 35 ක ඉඩම ප්‍රත්‍යාගණනය කර වර්තමාන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | COVID -19 වාතාවරණය මත සිදුකර ගත නොහැකි වූ ප්‍රත්‍යාගණනය කටයුතු 2021 වර්ෂයේ සිදු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යවා ඇත. | දේපළ පිරියත හා උපකරණ සහ හන්තාන උඩුවෙල ඉඩම ප්‍රත්‍යාගණනය කරමූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. |
| (ඊ) 2018 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන කාලපරිච්ඡේදයන් සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල සේවක පාරිතෝෂික වෙන්කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 ප්‍රකාරව ආයුගණන තක්සේරු ක්‍රමය | ආයතනය ආරම්භයේ පටන්ම පාරිතෝෂික දීමනා පනත පරිදි ගණනය කිරීම් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බව සඳහන් කරමි. | පාරිතෝෂික වෙන් කිරීමේදී ආයුගණක තක්සේරු ක්‍රමය භාවිතා කළ යුතුයි. |

(Actuarial Valuation Method) භාවිතා කළ යුතු වුවද එසේ සිදු නොකර පාරිතෝෂික සඳහා වෙන් කිරීම් රු. 81,579,772 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට සිදු කළ භෞතික තොග සත්‍යාපන වටිනාකම වෙනුවට තොග පොත් අනුව වටිනාකම වූ රු.26,186,951 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි. මේ නිසා භෞතික සත්‍යාපන වාර්තාවේ ඇතුළත් රු.218,436 ක් වූ තොග අයිතම 31 ක තොග ඌනතාවය හා රු.27,181 ක් වූ තොග අයිතම 09 ක අතිරික්තය ගැලපී නොතිබීමත්, වටිනාකම රු.3,686,388 ක් වූ පළුදු වූ හා පරිහරණය නොවන තොග පැවතීමත් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්කර ඇති තොග වටිනාකම නිවැරදි බවට පිළිගත නොහැකිවිය. | තොගය සත්‍යාපනය කර තිබුණද, ඌනතාවයන් හා අතිරික්තයන් සඳහා හේතු ලබාගෙන ඒවාට අදාළ නිවැරදි කිරීම් සිදුකරමින් පැවතුන බැවින් රු.26,186,951.00 ක වටිනාකම ගිණුම්වලට ඇතුළත් කරන ලදි. | තොග සමීක්ෂණ කටයුතු සිදු කර භෞතික සත්‍යාපන වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) 2017 වර්ෂයේදී රු. 7,892,731 කට මිලදී ගෙන ප්‍රාග්ධනිත කර තිබූ ප්‍රභාසංස්ලේෂක ඒකකය (Portable Photosynthesis System) 2018 වර්ෂයේදී නැවත වරක් ගිණුම්ගත කර වසරකට සියයට 15 ක් බැගින් ක්ෂය කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් රු.7,892,734 ක්, ක්ෂය වියදම රු.1,183,910 ක්, සමුච්චිත ක්ෂය රු.2,367,820 ක් හා සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.6,708,821 ක් වශයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | සිදුව ඇති වරද 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | සිදුව ඇති වරද ගිණුම්වල නිවැරදි කළ යුතුයි. |
| (ඇ) ආයතනයේ සෙස් බදු ආදායම ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය උපචිත පදනම වුවද, ලංකා සීනි පුද්ගලික සමාගමේ සෙවනගල අංශයෙන් 2020 වර්ෂය සඳහා ලැබිය යුතු රු.1,611,460 ක සෙස් බදු ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර ගල්ඔය වැවිලි | ලංකා සීනි පුද්ගලික සමාගම (සෙවනගල) වෙතින් සෙස් සම්බන්ධ දත්ත ඉල්ලා ලිපි යොමු කළනමුත් ලබාදී නොමැති බැවින් ලැබිය යුතු සෙස් ආදායම ගණනය කිරීම කළ නොහැකි විය.2019 වර්ෂය දක්වා මුදල් පදනමට සෙස් බදු ආදායම ගණනය සිදු කර තිබූ | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුකූල වන ආකාරයට උපචිත පදනම මත සෙස් බදු ගිණුම්ගත කළ යුතුයි. |

| | | |
|---|---|---|
| සමාගමෙන් 2019 වර්ෂය වෙනුවෙන් ලැබුණු රු.1,112,555 ක් සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.498,907 ක් වැඩියෙන්ද, ණයගැතියෝ රු.1,611,460 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | බැවින් ගල්ඔය සමාගමෙන් 2019 වර්ෂයවෙනුවෙන් ලැබූ සෙස් ආදායම 2020 වර්ෂයේ ආදායමක් ලෙස ලබාගෙන ඇත. | |
| (ඈ) ඇනවුම් කළ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලැබී නොතිබූ රු.17,350,591 ක් වටිනා ලී බඩු සහ උපකරණ, විද්‍යාගාර උපකරණ, කෘෂිකාර්මික උපකරණ, ක්ෂේත්‍ර උපකරණ හා අනෙකුත් උපකරණ ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ජංගම වගකීම් එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ඇණවුම්පත් ඉදිරිපත් කර ඉන්වොයිස්පත්ද ලැබී තිබූ බැවින් ඒවා 2020 වර්ෂයට අදාළ වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර ඇත. | නොලද භාණ්ඩ ගිණුම්ගත නොකළ යුතුයි. |
| (ඉ) 2018 වර්ෂයේදී ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කර එම වටිනාකම් ගිණුම්වලට ගැලපීමේදී නිල නිවාසවල තිබුණු වටිනාකම රු.4,785,456 ක් වූ ලී බඩු සහ උපකරණ ගිණුම්වලට ගලපා නොතිබුණි. | නිල නිවාසවල වටිනාකම රු.4,785,456කලිබඩු ස්ථාවර වත්කම් ලේඛනයට ලබාගෙන තිබූ නමුත් එකතු කිරීමේදී සිදුව ඇති දෝෂයක් නිසා මූල්‍ය ප්‍රකාශනවලින් මෙම මගහැරීඇත.2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කරන බව දන්වා සිටිමි. | මග හැරීමේ දෝෂය 2021 වර්ෂයේදී නිවැරදිව කළ යුතුයි. |
| (ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට අගය රු.4,453,369 ක් වූ භාණ්ඩාගාර බිල්පත් රු.4,825,436 ක් වශයෙන් ද,රු.260,855 ක් වූ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම රු. 552,652 ක් වශයෙන් ද පිළිවෙලින් රු.372,067 ක් හා රු.291,797 ක්වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | භාණ්ඩාගාර බිල්පත්වල නිවැරදි ආයෝජන වටිනාකම් හා පොළී නිවැරදි කිරීම් 2021 වර්ෂයේදී සිදු කරන ලදි. | භාණ්ඩාගාර බිල්පත් ආයෝජන හා ඊට අදාළ පොලිය නිවැරදිව ගිණුම්ගත කළ යුතුයි. |
| (උ) රාජ්‍ය හා පෞද්ගලික ආයතන 03 කට කලින් ගෙවීම් රු. 558,475 ක් වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති නමුත් ඒවා වියදම් වශයෙන් ගිණුම්ගත කිරීමට හෝ ශේෂ සනාථ කිරීම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී කලින් ගෙවීම් සහ අනෙකුත් තැන්පතු සඳහා වන ශේෂ සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | කලින් ගෙවීම් ශේෂයන්හි නිවැරදිතාවය සනාථ කරගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඌ) ස්ථාවර වත්කම් ලේඛනයට හා 2020 දෙසැම්බර් 31 දිනට භෞතික සත්‍යාපන වාර්තාවට ඇතුළත්ව තිබූ වර්ග 21 කට අයත් කාර්යාල උපකරණ, ආයුධ සහ ආම්පන්න ඒකක 67 ක වටිනාකම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර, එක් අංශයකින් තවත් අංශයකට මාරුකර තිබූ රු. 80,000 ක් වටිනා පුටු 10 ක් ද්වි ගණනය වී තිබුණි. | ස්ථාවර වත්කම් සත්‍යාපනයේදී හඳුනාගෙන ඇති මෙම වත්කම් අයිතමයන්හි මිලදීගත් වර්ෂයන් වෙන වෙනම හඳුනා ගැනීමට නොහැකි වීඇත. 2021 වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනයකර පොත්වලට ලබා ගැනීමට කටයුතු කරනු ඇත.<br>ද්වී ගණනයන් වී ඇති අයිතමයන් සඳහා 2021 වර්ෂයේ අදාළ නිවැරදි කිරීම් සිදු කරන බව දන්වා සිටිමි. | ස්ථාවර වත්කම් ලේඛනයට හා භෞතික සත්‍යාපන වාර්තාවට අනුකූලව නිවැරදිව ගිණුම් ගැලපිය යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 වර්ෂයේදී ආයතනයට විද්‍යාගාර උපකරණ ආනයනය කිරීමේදී භාණ්ඩ ලැබීම් නියමිත දිනට වඩා ප්‍රමාද වීම හේතුවෙන් ණයවර ලිපිවලට බැංකුව විසින් එකතු කරන ලද රු. 191,961 ක ගාස්තුවක් අදාළ සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර ගිණුම්වල දිගින් දිගටම ලැබිය යුතු ශේෂයක් ලෙස පෙන්වා තිබුණි. | ආයතන කිහිපයකින් ලැබීමට ඇති මෙම මුදල ඉල්ලුම් කර දිගින් දිගටම සිහි කැඳවීම් ලිපි යවා ඇත.2021 වර්ෂය තුළදී අයකර ගැනීමට අදාළ කටයුතු සිදු කරනු ඇත. | අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) සීනි නිෂ්පාදන ආයතන 05 කින් මාස 09 ක සිට වසර 5 කට වැඩි කාලයක් දක්වා හිඟහිට ඇති රු.7,150,551 ක් අයකර ගැනීමට ආයතනය අසමත් වී තිබූ අතර සීනි සමාගම් 2 කින් අයවිය යුතු සෙස් බදු රු.5,020,500 ක්, උක් දඩු සැපයීමේ ගාස්තු රු.1,130,051 ක් හා කන්තලේ සීනි සමාගමට ලබා දී තිබූ ණය මුදල් රු.1,000,000 ක් ඊට ඇතුළත්ව තිබුණි. | ලංකා සීනි සමාගමේ සෙවනගල හා පැල්වත්ත කර්මාන්තශාලාවල සීනි නිෂ්පාදන මත අයවිය යුතු සෙස් බදු මුදල් හා උක් දඩු සැපයීම වෙනුවෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට දිගින් දිගටම ලිපි යවා ඇතත් මේ වන තුරු ගෙවීම් කර නොමැත.<br>2010 වර්ෂයේ සිට කන්තලේ සීනි සමාගමෙන් අයවිය යුතුරු.1,000,000.00 ක මුදලඉල්ලා වරින් වර සිහිකැඳවීම් යවා ඇතත් ලැබීම සැක සහිතය. | අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ඡේදය | ආයතනයට භාණ්ඩ හා සේවා සැපයීම් වෙනුවෙන් 2020 වර්ෂයේ අවස්ථා 163 කදී ගෙවන ලද රු.978,360 ක් වූ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් වාර්තා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට වැට් බදු සම්බන්ධ වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරනු ඇත. | වැට් බදු ආවරණය සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 දිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දිය යුතුය. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 104 | අස්ථානගත වී ඇති බවට 2020 දෙසැම්බර් 31 දිනට වූ භෞතික සත්‍යාපන වාර්තාවේ ඇතුළත් වටිනාකම රු. 772,606 ක් වූ යතුරු පැදි, ජංගම දුරකථන, කාර්යාල උපකරණ සහ ලී බඩු වත්කම් ඒකක 19 ක් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සත්‍ය වශයෙන්ම සිදුව ඇත්තේ කුමක්ද යන්න හඳුනා ගැනීම සඳහා අදාළ අංශ වෙතින් ලබාගත් පැහැදිලි කිරීම් අනුව 2021 වර්ෂයේදී නියමිත පරිදි නැවත වාර්තා කිරීමට හෝ අදාළ අයගෙන් අයකරගැනීමේ කටයුතු කරන බව දන්වා සිටිමි. | අස්ථානගත වී ඇති වත්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ සිදු කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කන්තලේ හා කිලිනොච්චි ව්‍යාපෘතින්වල දෛනික වියදම් ආවරණය කර ගැනීම පිණිස රු.100,000 ක් බැගින් උපරිමයකට යටත්ව බැංකු කාඩ්පත් මඟින් ගනුදෙනු කිරීම සඳහා බැංකු ගිණුම් දෙකක් විවෘත කර තිබූ නමුත් අදාළ වියදම් හා එහි උපරිමය යනාදී උපදෙස් ලබා දී නොතිබීමෙන් අවශ්‍යතාවය ඉක්මවා බැංකුවෙන් මුදල් ලබා ගැනීමට ඉඩකඩ සලසා තිබූ බවට නිරීක්ෂණය වූ අතර එම ගිණුම්වලින් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.219,115 ක් හා රු.207,368 ක් වැය කර තිබුණි. | උප මධ්‍යස්ථානවල වැඩ පහසු කිරීමේ අරමුණින් 2015 වර්ෂයේ සිටමෙම ගිණුම් පවත්වාගෙන ආ නමුත් සිදුවන ගැටළුකාරී තත්වයන් මඟහැරීම සඳහා 2021 වර්ෂයේ සිට සුළු මුදල් ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමයට හරවාගෙන මෙම ගිණුම් වසා දැමීමටඅදාළ කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. | ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමේදී නිසි මූල්‍ය පාලන ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය. |
| (ආ) 2014 වර්ෂයෙන් පසුව ගනුදෙනු සිදු වී නොතිබූ බත්තරමුල්ල මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතිරිකිරීමේ ගිණුමේ2020දෙසැම්බර් 31 දිනට අභාවිතව පැවති ශේෂය රු.646,068 ක් වූ අතර එය කුමන අරමුණක් උදෙසා විවෘත කරනු ලැබුවේද යන්න පිළිබඳව තොරතුරු ඉදිරිපත් නොවීය. | අදහස් දක්වා නොමැත. | අක්‍රීය බැංකු ගිණුම් වසා දැමිය යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 11,630,769 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 41,630,865 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.30,000,096 ක ඌනතාවය අඩුවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආදායම රු.9,885,282 කින් ඉහළ යාම හා වියදම රු.20,114,814 කින් පහළ යාම මෙම ඌනතාවය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවනතා විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රාග්ධන ප්‍රදානය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායම් වශයෙන් හඳුනාගෙන තිබියදීත් ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය දිගින් දිගටම ඌණතාවයක් වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ එම ඌනතාවය රු. 11,630,769 ක් ද, සමුච්චිත ඌනතාවය රු.53,261,634 ක් ද විය. මෙම අයහපත් මූල්‍ය තත්ත්වය පාලනය කර ගැනීම කෙරෙහි කළමණාකාරිත්වයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) පෙර වර්ෂයේ රු.268,257,000 ක් වූ රජයේ පුණරාවර්තන හා ප්‍රාග්ධන ආධාරය සමාලෝචිත වර්ෂයේදී රු.299,180,000 ක් දක්වා රු.30,923,000 කින් හෙවත් සියයට 12 කින් ඉහළ ගිය ද, පෙර වර්ෂයේ රු.38,500,906 ක් වූ ආයතනය ඉපැයූ ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.17,463,188 ක් දක්වා සියයට 45 කින් පහළ ගොස් තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුදුපත්‍ර රෝගය (WLD) පාලනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ වෙන්කිරීම රු.3,250,000 ක් වුවද, එය රු.768,529 කින් හෙවත් සියයට 23.6 කින් ඉක්මවා රු.4,018,529 ක් වැයකර තිබුණු නමුත්, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | 2018, 2019, 2020 වර්ෂ සඳහා භාණ්ඩාගාරයෙන් අනුමත ප්‍රතිපාදන ලැබී නොතිබූ නමුත් සැලසුම්කළ ආකාරයට අවම මට්ටමින් මෙම කටයුතු කිරීමට සිදුවීම මත මෙම මුදල් වියදම් වීම සිදුව ඇති බව සඳහන් කරමි. | අනුමත අයවැය ප්‍රතිපාදන ඉක්මවා වැය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බව. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අනුමත රු.78,580,000 ක ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් ලැබුණු අග්‍රිමය රු.65,580,000 ක් වූ අතර එයින් වැය කළ මුදල රු.39,37,043 ක් විය. එසේ වුවද, ලද අග්‍රිමයට අනුව ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර නොතිබීමත්, ලද මුදලින් සියයට 40 ක් වූ රු.26,209,957 ක් වැය නොකර ආපසු යවා තිබීමත් හේතුවෙන් ප්‍රාග්ධන වියදම් කළමනාකරණය සතුටුදායක නොවන බවට නිරීක්ෂණය විය. | රටතුළ පැවති COVID-19 අවධානම මත සැලැසුම්කළ ආකාරයට ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීමට අපහසු වීමත්,රු.500,000 ඉක්මවන අයිතම සඳහා අනුමැතිය 2020.12.01 දින ලැබී තිබීමත් යන කාරණා හේතුවෙන් ප්‍රාග්ධන වියදම් සඳහා ලද අක් මුදල් ඉතිරිවීම් සිදු වූබව සදහන් කරමි. . | ආයතනයේ ආදායම් මනා ලෙස කළමනාකරණය කරගෙන අවශ්‍ය අවශ්‍යතා සම්පූර්ණ කරගත හැකි ආකාරයට මනා සැලසුම්කරණයක් තිබිය යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොළඹ කාර්යාලයේ රියදුරන්ට නේවාසික පහසුකම් සැපයීම සඳහා බත්තරමුල්ල ප්‍රදේශයෙන් කුලියට ගෙන මාස 23 ක් පාවිච්චි කළ කාමරයේ බදු ගිවිසුම 2019 දෙසැම්බර් මස අවලංගු කිරීමෙන් පසු ගිවිසුම ප්‍රකාරව ආපසු ලැබිය යුතු රු.90,000 ක තැන්පතු මුදලින් රු.45,530 ක් අඩුකර ගෙන තිබුණ ද, ඒ පිළිබඳව කිසිදු විමසීමක් හෝ පරීක්ෂණයක්සිදු කර නොතිබුණි. | මේ පිළිබදව පොලිසියේ මැදිහත් වීමක් ලබාගෙන අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | විධිමත් පරීක්ෂණයක් සිදු කර නිසි පියවර ගත යුතුය. |
| (ආ)උක් පර්යේෂණ ආයතනය වෙත 2004 වර්ෂයේදී භුක්තිය භාරදී පර්යේෂණ වගාවන් පවත්වාගෙන යනු ලබන දෙනියාය එන්සල්වත්ත වතුයායේ හෙක්ටයාර් 5.7 ක ඉඩමේ අයිතිය ලබාගෙන නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණි. එසේ තිබියදී සමාලෝචිත වර්ෂයේ දී රු.2,989,955 ක වියදමක් දරා එහි පිවිසුම් මාර්ගය, රූඳවුම් බැම්ම,මුරකුටිය සහ ගේට්ටුවක් සවි කර තිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවට අයත් මතුරට වැවිලි සමාගටම බදු අයිතිය පවතින මෙම ඉඩමේ වන්දි මුදල් ගෙවීම පිළිබද පවතින ගැටලුව නිරවුල් කරගැනීම සඳහා කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මොරවක දිසා අධිකරණයේ ගොනුකර ඇති නඩුවේ තීන්දුව අනුව අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. | සංවර්ධන කටයුතු කිරීමට පෙර නිරවුල් අයිතිය ලබා ගැනීම නිලධාරීන්ගේ වගකීම වේ. |
| (ඇ) ආයතනයේ සේවකයන්ගේ දරුවන්ට ශිෂ්‍යාධාර ලෙස මසකට රු.1000 ක් සහ පාසල් ප්‍රවාහන දීමනා ලෙස රු. 1,600 ක් හා රු.3000ක් වශයෙන් ලබාදීම සඳහා රු.500,000 ක ශිෂ්‍යාධාර අරමුදලක් | පාලක මණ්ඩල අනුමැතිය මත කාර්යය මණ්ඩලය දිරි ගැන්වීමේ ක්‍රමයක් ලෙස දිගු කාලයක් තිස්සේ ශිෂ්‍යාධාර වැඩ සටහන ක්‍රියාත්මක කරන බව සහ අභ්‍යන්තර නිල නිවාසවල පදිංචිව සිටිනනිලධාරීන්ගේ දරු | රජයේ නීති, රීති හා රෙගුලාසීන්ට අනුකූල වන වරප්‍රසාද |

| | | |
|---|---|---|
| පිහිටුවා තිබුණද මෙයට පදනම් වූ නෛතික පසුබිම දක්වා නොතිබුණි. | දැරියන්ට පාසැල් ප්‍රවාහන පහසුකම් ලබාදීමට ආයතනයේ බස් රථයක් නොමැතිකම නිසා ප්‍රවාහන වියදම ප්‍රතිපූර්ණය කරනු ලබන බව දැනුම් දෙමි. | පමණක් නිලධාරීන්ට හිමි විය යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයට නීත්‍යානුකූල හිමිකම ලබාගෙන නොතිබූ කන්තලේ පිහිටි හෙක්ටයාර් 200 ක පමණ භූමියක 2015, 2017 හා 2020 වර්ෂවලදී මීටර් 4550 ක් දිග විදුලි වැටක් ඉදිකර අලුත්වැඩියා කිරීම සඳහාරු.3,472,135 ක් ද, උක් දඩු සඳහා උණුදිය ප්‍රතිකාර ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා රු.5,404,458 ක් ද වශයෙන් එකතුව රු.8,876,593 ක් වැයකර තිබූ අතර කන්තලේ සීනි කර්මාන්තශාලාව වසර ගණනාවක සිට අක්‍රීයව පැවතීම හේතුවෙන් දරන ලද වියදම් නිෂ්කාර්යය බවට පත්වී තිබුණි. | රජය විසින් කන්තලේ සිනි සමාගම නැවත ආරම්භ කිරීම සඳහා ගන්නා ලද උත්සහයන් මත රේඛීය අමාත්‍යාංශය විසින් දෙන ලද උපදෙස් අනුව අවශ්‍ය පර්යේෂණ සහය ලබාදීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන විශේෂ අරමුදලක් මගින් කන්තලේ සීනි සමාගම පිහිටි රජයට අයත් භූමියෙන් හෙක්ටයාර් 200 ක පමණ භූමිය තුළසංවර්ධන කටයුතු සිදු කර මේ දක්වා නඩත්තු කරමින් පවත්වාගෙන යනු ලබයි. මෙම භූමියේ නීත්‍යානුකූල ඉඩම් අයිතිය ලබා ගැනීමට ඉල්ලුම් කර ඇත. | සංවර්ධන වියදම්වලින් නිසි ප්‍රතිඵල ලබාගත යුතුය. |

### 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙනියාය උප මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගය සම්බන්ධ කොන්ත්‍රාත්තුවේදී හා බෝග සම්පත් කළමනාකරණ අංශයේ විද්‍යාගාර මේසය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේදී අවශ්‍යතාවය හඳුනාගෙන නිසි පිරිවිතර සකස් කිරීමකින් තොරව පිළිවෙලින්රු.1,200,936 ක හා රු.582,111 ක වටිනාකම්වලටකොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් අනතුරුව ආයතනයේ ඉහළ කළමණාකාරිත්වය විසින් වාචික උපදෙස් මත ප්‍රමාණ බිල්පත්‍රවල සඳහන් නොවන කාර්යයන් ඉටු කරවා ගැනීම නිසා කොන්ත්‍රාත්කරුවන් විසින් පිළිවෙලින් රු.2,992,591 ක් හා රු.1,149,897 ක් බැගින්ඉදිරිපත් කළ බිල්පත්වලට පිළිවෙලින් රු.850,463 ක් හා රු.616,140 ක් බැගින් ගෙවීම් කර පළමු කොන්ත්‍රාත්තුව සඳහා රු.1,522,318 ක මුදලක් ගිණුම්වලින් වෙන්කර තිබීමෙන් ආයතනයේ කොන්ත්‍රාත් කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් | භාහිර තාක්ෂණික නිලධාරීගේ ඇස්තමේන්තුවල පැවති දෝෂයන් හේතුවෙන් වාචිකව සාකච්ඡාකර මෙම වැඩ කටයුතු සිදුකර ඇත. කොන්ත්‍රාත් ගිවිසුම්වල අන්තර්ගත කාර්යයන් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශිත මුදලපමණක් ගෙවා ඇත.වැඩ අධිකාරීගේ මැනුම් වටිනාකම් මත පදනම්ව ඉතිරිමුදල් ගෙවීමට සලකා බලමින් සිටී. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ඉදිකිරීම් සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| බැහැරව අවිධිමත් ආකාරයට සිදු වන බවට නිරීක්ෂණය විය. | | |
| (ආ) බෝග පෝෂණ අංශයේ සාම්පල් පිළියෙල කිරීමේ ගොඩනැඟිල්ලට නව කොටසක් එකතු කිරීමේ ඇස්තමේන්තුව ප්‍රකාරව රු.1,828,081 කට 2017 වර්ෂයේ පිරිනැමූ කොන්ත්‍රාත්තුවේ වහලය කුළුණු නොමැතිව ඉදිකිරීම හේතුවෙන් පහත් වීම නිසා කොන්ත්‍රාත්කරුට රු.581,341 ක මුදලක් ගෙවා කොන්ත්‍රාත්තුව අතරමඟ නතර කොට එම වහලය ඉවත් කර2021 වර්ෂයේ දීරු.987,043 ක වියදමකින් වහලය නැවත සකස් කර තිබූ අතර එහි ඉතිරි වැඩ කොටස වාචික උපදෙස් මතවෙනත් කොන්ත්‍රාත්තුකරුවෙකු ලවා රු.758,373 ක් ගෙවා 2020 වසරේදී ඉටු කර ගෙන තිබුණි. ඒ අනුව මෙය අරපිරිමැසුම්දායී ගනුදෙනුවක් බවට නිරීක්ෂණය කළ නොහැකි විය. | භාහිර තාක්ෂණ නිලධාරීගේ ඇස්තමේන්තුවල පැවති දුර්වලතාවයන් නිසා අතිරේක වැඩ හා වහලය නැවත සකස් කිරීමට සිදුවූ අතර මුල් ඇස්තමේන්තුවේ අන්තර්ගත නොවූ වැඩ අධිකාරීගේ වාචික උපදෙස් අනුව සිදු කළ කාර්යයන් සඳහා කළ ගෙවීම් සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව කටයුතු කරමින් සිටි. | ආයතනයේ අවශ්‍යතාවය හඳුනාගෙන විධිමත් අනුමත ඇස්තමේන්තු පදනම් කර ගනිමින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ඉදිකිරීම් සිදුකළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට ආයතනයේ ජ්‍යෙෂ්ඨ, තෘතීය හා ද්විතීය අනුමත කාර්ය මණ්ඩලය 86 කින් 16 ක් පුරප්පාඩුව පැවතියදී ප්‍රාථමික කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව107 ක් ද, තත්‍ය සංඛ්‍යාව 136 ක්ද වීමෙන් 193 ක් වූ මුළු අනුමත කාර්ය මණ්ඩලයට වඩා තත්‍ය කාර්ය මණ්ඩලය 13 කින් වැඩි විය. තවද, ආයතනයේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරී වන අධ්‍යක්ෂ තනතුර සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට පුරප්පාඩුව වැඩ බැලීමේ පදනමින් පවත්වාගෙන යමින් තිබුණි. | සේවකයන් 37 දෙනෙකු දරන්නාට පමණක් පෞද්ගලික වන සේ සේවයේ ස්ථිර කර තිබීම නිසා 107 ක් වූ ප්‍රාථමික අනුමත කාර්ය මණ්ඩලය තත්‍ය සේවක සංඛ්‍යාව 136 ක් වේ. අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක තනතුරේ සේවය කළනිලධාරියා කලින් දැනුම් දීමකින් තොරව 2020/09/15 දින හදිසියේ ඉල්ලා අස්වීමෙන්වූ පුරප්පාඩුව පිරවීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව සඳහන් කරමි. | පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 06 දිනැති අංක පීඊඩී/ 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.51 හා 6.5.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මේ වන විට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟකෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු යුතුය. |

### 4.2 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තා පිළියෙල කර ඇත. අමාත්‍යාංශය වෙත යැවීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | නියමිත දින වකවානු ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |